**ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක. 02/93**

මගේ අංකය :- ඒ/සීසී /57 (11 වෙළුම)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ,
ඒකාබද්ධ සේවා අංශයේ දී ය.
1993 අප්‍රේල් මස 30 වෙනි දින.

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් සහ,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**රාජ්‍ය සේවයේ ලිපිකරු හා සමාන්තර සේවාවන්හි සේවා**
**නියුක්ත උපාධිධාරීන්ට සහන සැලසීම**

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ ලිපිකරු හා සමාන්තර සේවාවන්හි උපාධිධාරීන් බොහොමයක් සිටින අතර, ඔවුන්ට ඉහළ තනතුරු සඳහා පෙනී සිටීමට ඇති ඉඩකඩ පුළුල් කිරීමේ අවශ්‍යතාවය රජයට අවබෝධ වී ඇත. ඒ අනුව ඔබ ආයතනයේ බඳවා ගැනීම් වලදී සහ උසස් කිරීම් වලදී මතු දැක්වෙන සහන සැලසීමට රජය තීරණය කර ඇත.

02. 1993.01.26 දින සිට රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ උපාධිය මූලික සුදුසුකම සේ සැලකෙන, මතු දැක්වෙන තනතුරු සඳහා බඳවා ගැනීමේදී / උසස් කිරීමේදී එනම්,

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා විදේශ සේවය, කම්කරු නිලධාරී සේවය, රේගු සේවය සහ බලයලත් නිලධාරීන් වැනි විවිධ සේවාවලට බඳවා ගැනීම් වලදී අදාළ වයස් සීමාව පිළිබඳ සියලුම අවශ්‍යතාවයන් මෙම නිලධාරීන් සම්බන්ධයෙන් හා රාජ්‍ය සේවයේ මාණ්ඩලික නොවන සමාන තනතුරු දරණ සෙසු උපාධිධාරීන් සම්බන්ධයෙන් ඉවත් කිරීමටත්,

(ආ) මෙම නිලධාරීන්ට හා මාණ්ඩලික තනතුරු නොදරණ රාජ්‍ය සේවයේ අනෙකුත් උපාධිධාරීන්ට රජයේ සේවයට බඳවා ගැනීමේ මට්ටමින් පැවැත්වෙන විභාග සඳහා පෙනී සිටින වාර ගණන සීමාවකින් තොරව පෙනී සිටීමටත් හැකි වන පරිදි,

(ඇ) වර්තමාන වැටුප්, සේවා කොන්දේසි හා දෙන ලද සහනවල වෙනසක් නොකර මාණ්ඩලික තනතුරු නෙදරණ ඌන සේවාවන්හි නියුක්ත උපාධිධාරීන්, උපාධිධාරී ස්ථාපන සේවයට අන්තර්ග්‍රහණය කිරීමටත්,

සියළුම බඳවා ගැනීම් / උසස් කිරීම් පිළිබඳ නිලධාරීන් විසින් වගබලා ගත යුතුය.

අ.කලේ/එම්.එන්. ජුනයිඩ්
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය